සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

GIT	S	I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ..... සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I කාලය පැය එකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පරිගණක පරිණාමයේ දී සිදු වූ සුවිශේෂී වෙනස්කම් ඇතුලත් පිළිතුර වනුයේ
   1. මිල වැඩිවීම , ධාරිතාවය අඩුවීම , සැකසිමේ වේගය වැඩිවීම , ප්‍රමාණයෙන් විශාලවීම
   2. මිල අඩුවීම , ධාරිතාවය අඩුවීම , සැකසිමේ වේගය වැඩිවීම , ප්‍රමාණයෙන් කුඩාවීම
   3. මිල අඩුවීම , ධාරිතාවය වැඩිවීම , සැකසිමේ වේගය වැඩිවීම , ප්‍රමාණයෙන් කුඩාවීම
   4. මිල වැඩිවීම , ධාරිතාවය වැඩිවීම , සැකසිමේ වේගය අඩුවීම , ප්‍රමාණයෙන් විශාලවීම

2. සුධර්මා මහත්මිය වෙබ් කැමරාව භාවිතා කරමින් පරිගණකය ආධාර කරගෙන විදෙස් රටක සිටින තම පුතු සමග සංවාදයේ යෙදෙයි. මෙම සංසිද්ධියේ දී වෙබ් කැමරාවට අදාළ කාර්යය වනුයේ කුමක්ද?
   1. ආචයන උපක්‍රමයක් ලෙස භාවිත විම
   2. ආදාන උපක්‍රමයක් ලෙස භාවිත විම
   3. ප්‍රතිදාන උපක්‍රමයක් ලෙස භාවිත විම
   4. ආදාන සහ ප්‍රතිදාන උපක්‍රමයක් ලෙස භාවිත විම

3. පහත කුමන ප්‍රකාශය /ප්‍රකාශ නාභිය(Hub) හා ස්විචය (Switch) සම්බන්ධයෙන් සත්‍ය වේද?
   A. ස්විචයේ දත්ත සම්ප්‍රේෂණ වේගය නාභියේ දත්ත සම්ප්‍රේෂණ වේගයට වඩා වැඩිය.
   B. නාභිය විසින් දත්ත සියළුම පරිගණක වෙත බෙදාහරිනු ලබයි.
   C. ස්විචය දත්ත අදාළ පරිගණක වෙත පමණක් යවනු ලබයි.
   E. නාභිය ඒකපථ ක්‍රමයටද ස්විචය පූර්ණ ද්විපථ ක්‍රමයටද දත්ත සම්ප්‍රේෂණය කරයි.

   1. A,B, C 2. A, B, C,D 3. B, C, D 4. A, C, D

4. පරිගණකයක් ස්ථානීය පෙදෙස් ජාලයකට (Local Area Network) සම්බන්ධ කිරීමේ දී වඩාත් ප්‍රයෝජනවත් වන්නේ පහත දැක්වෙන සංරචක අතුරින් කවරක්ද?
   1. රවුටරය (Router)
   2. ජාල අතුරුමුහුණත් කාඩ්පත(Network Interface Card)
   3. පරිගණක තිරය (Screen)
   4. මොඩමය (Modem)

5. ධාරිතාවය හා ප්‍රවේශ වේගය ඉහළම ආචයන උපාංග දෙක පිළිවෙලින් දැක්වෙනුයේ,
   1. චුම්භක පටිය , සසම්භාවී පිවිසුම් මතකය
   2. චුම්භක පටිය , රෙජිස්තර මතකය
   3. වාරක මතකය , දෘඩ තැටිය
   4. දෘඩ තැටිය , සංචිත මතකය

6. පෞද්ගලික ආයතනයක් විසින් සිය සේවකයන්ගේ දෛනික පැමිනීම වාර්තා කිරීම සඳහා ඇගිලි සලකුණු සුපරීක්ෂකයක් භාවිතා කරනු ලබයි. මෙම පද්ධතිය සඳහා ආදානය,ක්‍රියාවලිය හා ප්‍රතිදානය නිවැරදි අනුපිළිවෙලකට දැක්වෙන්නේ පහත සඳහන් කවරකින්ද?

   1. ඇගිලි සලකුණ ඇතුලු කිරීම, දත්ත සමුදාය පිරික්සීම, දෛනික පැමිණීම සටහන් වීම
   2. දත්ත සමුදාය පිරික්සීම, ඇගිලි සලකුණ ඇතුලු කිරීම, දෛනික පැමිණීම සටහන් වීම
   3. දෛනික පැමිණීම සටහන් වීම, දත්ත සමුදාය පිරික්සීම, ඇගිලි සලකුණ ඇතුලු කිරීම
   4. දත්ත සමුදාය පිරික්සීම, දෛනික පැමිණීම සටහන් වීම, ඇගිලි සලකුණ ඇතුලු කිරීම

7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි අනිසි භාවිතයක් නොවන්නේ,
   1. වෛරස පැතිරවීම
   2. බ්ලොග් අඩවියක් සැකසීම
   4. සමාජ ජාල තුළින් නොගැලපෙන මිතුරන් ඇසුරු කිරීම
   3. පින්තූර වීඩියෝ පට වැනි දෑ විකෘත කර නිපදවීම

8. නිමල් වෙළඳපොළට ගොස් තම දරුවාට පරිගණකයක් මිලදී ගත්තේය. එහි පහත සඳහන් තොරතුරු ලේබලයක ලියා අලවා තිබුණි.

සකසනය 3(a) .....
දෘඪතැටියේ ධාරිතාව 40Gb
මතක ධාරිතාව 2Tb

සකසනයේ වේගය දක්වා ඇති ස්ථානයේ දැක්වෙන (a) හිස්තැනට වඩාත් සුදුසු වන්නේ
1. Gb 2. Hz 3. GHz 4. GBz

9. 1010_2 සංඛ්‍යාව තුල්‍ය වන්නේ පහත සඳහන් කවර දශමක සංඛ්‍යාවටද?
1. 5 2. 6 3. 10 4. 12

10. පහත දැක්වෙන කුමක් ටෙරා බයිට් 2 ට (2 Tb) ආසන්න ලෙස තුල්‍ය වේද?
1. 2^{10} GB 2. 2×2^{20} MB 3. 2×2^{21} KB 4. $2^{10} \times 2^{10}$ MB

11. පරිගණකය අක්ෂර හා අනුලක්ෂණ නිරූපනය සඳහා කේත ක්‍රම යොදාගනී. එවැනි එක්තරා කේත ක්‍රමයකදී ඉංග්‍රිසි හෝඩියේ අකුරු නිරූපනය සඳහා අනුයාත ද්විමය සංඛ්‍යා යොදා ගත්තේ නම් H අක්ෂරය 1001000 ලෙස කේතනය වී තිබුණි නම් 1000010 මගින් කේතනය වී ඇත්තේ කුමන අක්ෂරයද?
1. A 2. B 3. C 4. D

12. පහත දී ඇති සත්‍යතා වගුව නිරූපනය කරන තාර්කික පරිපථය කුමක්ද?

X	Y	F
0	0	1
0	1	0
1	0	0
1	1	0

1 
3 
2 
4 

13. පහත රූපයේ දැක්වෙන තාර්කික පරිපථයෙන් නිරූපනය කරන බූලියානු ප්‍රකාශය වන්නේ



1. $X.\bar{X} = 1$ 2. $X + 1 = 1$ 3. $X + \bar{X} = 1$ 4. $X.1 = 1$

14. ..... යනු අන්තර්ජාලයේ සේවාවකි. හිස්තැන පිරවීම සඳහා යෝග්‍ය වන්නේ පහත කුමක්ද?
1. විද්‍යුත් තැපෑල (Email) 2. IP ලිපිනය 3. නියමාවලිය (Protocol) 4. වෙබ් අතිරික්සුව (web browser)

15. IP ලිපින සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ
   1. එකම IP ලිපිනයක් ජාලයක් තුළ පවතින පරිගණක කිහිපයකට තිබිය හැක
   2. IP ලිපිනය අන්තර්ජාලයේ ඇති සෑම පරිගණකයක්ම අනන්‍යව හඳුනා ගැනීමට භාවිතා කරයි.
   3. IP ලිපින අන්තර්ජාලයේ සේවා සපයන ආයතන විසින් ලබා දේ.
   4. IP ලිපින දශම තිත් වලින් වෙන් කරන ලද 0- 255 දක්වා වූ අගයන් හතරකින් සමන්විත වේ.

16. කමල්ට යැවීමට සකසමින් සිටි විද්‍යුත් තැපැල් ලිපියක් සම්පූර්ණ කර ගැනීමට පෙර වැසී ගියේය. මෙය තිබිය හැකි ෆොල්ඩරය වනුයේ
1. Inbox 2. Out box 3. Draft 4. Trash

17. පහත සඳහන් වගන්ති සලකා බලන්න.

a) සෑම වෙබ් අඩවියකටම එයටම අනන්‍ය වූ සම්පත් නිස්චායකයක් (URL)පවති

b) අධි සන්ධානයක් යනු (hyperlink) විද්‍යුත් ලේඛනයක් එම ලේඛනය තුළම වෙනත් ස්ථානයකට සම්බන්ධ කරවන හෝ මුළුමනින්ම නව ලේඛනයකට සම්බන්ධ කරවන අවයවයකි

c) අධිපාඨ තැන් මාරු නියමාවලි (http) වෙබ් දත්ත හුවමාරුව සඳහා භාවිතා කරයි.

1. a හා b පමණි 2. a හා c පමණි 3. b හා c පමණි 4. a , b හා c සියල්ලම

18. අන්තර්ජාලය තුළ වෙබ් අඩවියක් ....①... කරනු ලබන්නේ වෙබ් සර්වර් පරිගණකය තුළයි. වෙබ් සේවා දායක පරිගණකය අනන්‍යව (Uniquely) හඳුනාගනු ලබන්නේ ....②..... භාවිතයෙනි. ...③..... එහි ඇති ගොනුවක් අනන්‍යව හඳුනා ගැනීමට භාවිතා කරන අතර එයට පිවිසීමට වෙබ් අතිරික්සු (web browser) මෘදුකාංග යොදා ගනියි.

පහත සඳහන් කුමක් මඟින් නිවැරදිව පිලිවෙළින් ①, ② හා ③ ප්‍රතිස්ථාපනය කළ හැකි ද?

(විශ්ව සම්පත් නිශ්චාකය (URL), සත්කාර (hosting), IP ලිපිනය (IP address), වසම් නාමය (domain name)]

1. URL, hosting, IP address
2. hosting, IP address, URL
3. hosting, IP address, domain name
4. URL, hosting, IP address

19. http://www.edupub.gov.lk/e-books/english/ict.pdf ලෙස දක්වා ඇති නාමය

1. IP ලිපිනයක්
2. විශ්ව සම්පත් නිශ්චායකයකි (URL)
3. නියමාවලියකි
4. අන්තර්ජාල සේවාවකි

20. වදන් සැකසුම් (Word processing) ලියවිල්ලක් සම්බන්ධව පහත ප්‍රකාශ වලින් අසත්‍ය ප්‍රකාශ වන්නේ,

a) එක් වරක් Copy කල දෙයක් කිහිප වරක් Paste කල හැකිය

b) Delete කල දෙයක් නැවත ආපසු ලබා ගත නොහැකිය

c) Cut Paste මඟින් එක් තැනක තිබූ වචනයක් වෙනත් තැනකට ගෙනයා හැකිය

1. b පමණි 2. a සහ c පමණි 3. b සහ c පමණි 4. a,b සහ c

21. පහත A,B,C තුළින් නිරූපනය වන්නේ ,



1. අලුප් කිරීම(redo) සුරැකීම (save), ලොප් කිරීම(undo)
2. සුරැකීම (Save), ලොප් කිරීම (undo), අලුප් කිරීම (redo)
3. ලොප් කිරීම, (Undo), පිළිවෙලකට සැකසීම (sort), අලුප් කිරීම (redo)
4. ලොප් කිරීම (Undo) , සුරැකීම(save), අලුප් කිරීම (redo)

22. වදන් සැකසුම් මෘදුකාංගයක් මඟින් සකස් කල ලේඛනයක මාතෘකාව පිටුවෙහි මැදට ගැනීමට අදාළ කෙටි යතුර වනුයේ,

1. Ctrl + A 2. ctrl + E 3. Ctrl + J 4 Ctrl + C

23. සමර්පණ මෘදුකාංගයක (Presentation Software) කදා දැක්මක් (Slide show) මුල සිට ආරම්භ කිරීම සඳහා මෘදුකාංගයේ ඇති පහත දැක්වෙන කුමන නිරූපකය (Icon)භාවිත කරයිද?

1. 2. 3. 4.

24. සමර්පණයක කදා අතර හුවමාරුව සඳහා සජීවකරණ සංස්කරණය සඳහා භාවිතා කෙරෙනුයේ මින් කුමක්ද?

1. කදා සංක්‍රමණය Slide Transition
2. සජිවිකරණ ප්‍රතිබිම්බය Animation Objects
3. ජිවිකරණ ක්‍රමය Animation Scheme
4. කදා සැකසුම Slide Design

25. සමර්පන මෘදුකාංග සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සලකා බලන්න.
A - කදා දැක්මක්(slide show) තුළදි B යතුර එබීමෙන් සම්පූර්ණ කදාවම කළු පැහැ ගැන්වේ
B - Ctrl + M යන යතුරු එබීමෙන් නව කදාවක් (slide) ලබා ගත හැක

ඉහත වගන්ති සම්බන්ධයෙන් සත්‍ය වන්නේ
1. A සත්‍යවන අතර B අසත්‍ය වේ 2. A හා B අසත්‍ය වේ.
3. A අසත්‍යවන අතර B සත්‍ය වේ 4. A හා B සත්‍ය වේ.

26. දත්ත සමුදාය කළමනාකරණයේදී වගු දෙකක් අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා වගු දෙක අතර තිබියයුතු ලක්ෂණයක් වන්නේ
1. වගු දෙකෙහිම කිසිම ක්ෂේත්‍රයක් සමාන නොවිය යුතුය
2. වගු දෙකෙහි එක් ක්ෂේත්‍රයක් හෝ සමාන විය යුතුය
3. වගු දෙකෙහි සියලු ක්ෂේත්‍රයන් අනිවාර්යයෙන් සමාන විය යුතුය
4. වගු දෙකෙහි තිබිය යුතු ක්ෂේත්‍ර ගණන අනිවාර්යෙන්ම සමාන විය යුතුය.

27. ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායක් පිළිබඳව පහත ප්‍රකාශ සලකා බලන්න.
A - වගුවක රෙකෝඩයක් අනන්‍යව හඳුනාගතහැකි ක්ෂේත්‍රයක් හෝ වැඩි ගණනක් සංයෝජනය කිරීමෙන් සංයුක්ත යතුර (Composite key) නිර්මාණය වේ.
B - සම්බන්ධිත දත්ත සමුදායේ දත්තයන්හි සමතිරික්තතාවය (Data Redundancy) වැඩිකිරීමෙන් කාර්යක්ෂමතාව වැඩිකර ගත හැක.
C - තනි වස්තුවකට හෝ පුද්ගලයෙකුට හෝ අදාළ දත්ත ඇතුලත් ක්ෂේත්‍ර සමූහයක් රෙකෝඩයක් ලෙස හැඳින්වෙයි.
ඉහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය වන්නේ,
1. A පමණි 2. A හා C පමණි 3. A හා B පමණි 4. A ,B හා C යන සියල්ලම

- **28- 29 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත දැක්වෙන දත්ත සමුදාය වගුව භාවිතා කරන්න**

Pro num	Item name	Quantity	Unit price
S001	Pencil	4	15
S002	Pen	7	20
S003	Pencil box	8	200

28. මෙම වගුවේ ඇති රෙකෝඩ සංඛ්‍යාව සහ ක්ෂේත්‍ර සංඛ්‍යාව පිළිවෙළින්
1. 4 , 4 2. 3 , 4 3. 4 , 3 4. 3 , 3

29. Pro_Num සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූපය කුමක්ද?
1. බූලියානු (Boolean) 2. මිල (Currency) 3. සංඛ්‍යාත්මක (Number) 4. පාඨ (Text)

- **පහත දැක්වෙන වැඩපත භාවිතා කර අංක 30 සිට 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

	A	B	C	D	E	F	G
1	භාණ්ඩය	ඒකක ගණන	ඒකක මිළ	මුළු වටිනාකම	වට්ටම	ශුද්ධ වටිනාකම	
2	Monitor	3	3500				
3	Digital camera	4	16500				
4	UPS	2	4500				
5	Mother board	2	10500				
6	Flash Drive	8	4900				
7							

30. D2 කෝෂයට ඇතුළත් කළ යුතු සමීකරණය වන්නේ,
1. B2*C2 2. =B2,C2 3. =B2:C2 4. =B2*C2

31. භාණ්ඩ සඳහා මුලු වටිනාකමෙන් 5%ක වට්ටමක් ලබා දෙන්නේ නම් අදාළ පිළිතුර ලබා ගැනීමට E2 කෝෂයේ ලිවිය යුතු සමීකරණය වන්නේ,
1. =D2/100*5*B2 2. =D2*5%*B2 3. =D2*5% 4. D2*5%*3

32. ශුද්ධ වටිනාකම්වල එකතුව ලබා ගැනීමට F 7 හි ලිවිය යුතු සමීකරණය කුමක්ද?
1. =SUM(F2:F6) 2 =F2.F6 3. = TOTAL(F2:F6) 4. = COUNT(F2..F6)

33. HTML උසුලන සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න
A - <a> උසුලනය මගින් අධිසන්ධාන නිර්මාණය කරයි.
B - <font> උසුලනය මගින් අකුරුවල වෙනස්කම් සිදු කරයි.
C - උසුලනය මගින් අංකිත නොවන ලැයිස්තු ඇතුලත් කරයි.
ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ,

1. A පමණි. 2. A හා B පමණි. 3. B හා C පමණි. 4. A, B හා C යන සියල්ලම

34. රූප ගොනුවල ගොනු දිගු පමණක් අඩංගු වරණය කුමක්ද?
1. DOCX, MP_3 , PNG 2. RAW, JPEG, BMP
3. PNG, RAW, MP3 4. PPTX, BMP, PNG

35. පහත හිස්තැනට ගැලපෙන තනතුරු නාමය වන්නේ.
..... විසින් තොරතුරු පරිගණක වලට ඇතුලත්වන අන්දම හා තොරතුරු අවශ්‍ය පුද්ගලයන්ට එය ලැබෙන අන්දම පෙන්වීම මෙන්ම විවිධ පරිගණක පද්ධති සැලසුම් අත්හදා බැලීමද සිදු කරයි.
1. වෙබ් සැලසුම්කරු 2. පද්ධති විශ්ලේෂක 3. ජාල පරිපාලක 4.පරිගණක දෘඩාංග ඉංජිනේරු

36. පහත දී ඇති උපක්‍රම සලකන්න.
A- මූසිකය
B- ස්පර්ශක තිරය
C- ලිවිය හැකි බාහිර ධාවකය
ඉහත කුමන උපක්‍රම ආදාන සහ ප්‍රතිදාන යන දෙකම සඳහා භාවිතා කළ හැකිය.
1. A සහ B පමණි 2. A සහ C පමණි
3. B සහ C පමණි 4. A,B සහ C සියල්ලම

37. පරිගණකයක භෞතික ආරක්ෂාව හා තාර්කික ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පිළිවෙලින්
1. නිර්බාධිත ජව සැපයුම් ඒකකය (UPS) භාවිතය හා මුරපද (pass word) භාවිතය
2. නිර්බාධිත ජව සැපයුම් ඒකකය (UPS) හා අකුණු සන්නායක භාවිතය
3. ගිනි පවුර (Firewall)යෙදීම හා අකුණු සන්නායක භාවිතය
4. ප්‍රතිවෛරස මෘදුකාංග(Antivirus) යෙදීම හා මුරපද (pass word) භාවිතය

38. අන්තර්ජාලය හරහා නොමිලේ බාගතහැකි මෙන්ම පරිශීලකයාට අවශ්‍ය පරිදි අතුරු මුහුණත වෙනස්කල හැකි මෘදුකාංග හඳුන්වනු ලබන්නේ,
1. හිමිකම් සහිත මෘදුකාංග 2. යෙදුම් මෘදුකාංග
3. විවෘත කේත මෘදුකාංග 4. වානිජ මෘදුකාංග

39. පහත දැක්වෙන ඒවායින් කවරක් පරිගණක වෛරස් සඳහා මූලාශ්‍ර විය හැකිද?
A. චෞර මෘදුකාංග
B. සුපිරික්ෂක
C. පොදුවේ භාවිතා වන සැනෙලි මතක
1. A හා B පමණි 2. A හා C පමණි
3. B හා C පමණි 4. A,B හා C සියල්ලම

40. පහත සඳහන් දෑ සලකන්න
D. පරිගණක දෘඩාංග පිරිවිතර
E. වෙළඳ ආයතනයෙහි කීර්ති නාමය
F. වගකීම් කාලය සහ අලෙවියෙන් පසු සේවාව
පරිගණකයක් මිලදි ගන්නා විට ඉහත සඳහන් කුමන කරුණු වැදගත් වේද?

1. A පමණි 2. A හා C පමණි 3. A හා B පමණි 4. A,B හා C පමණි

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

GIT	S	II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ..... සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II කාලය පැය දෙකයි

වැදගත්

ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) a) AND ද්වාරයේ සංකේතය ඇඳ සත්‍යතා වගුව ගොඩනගන්න.

b) පහත සඳහන් ප්‍රකාශයට තුල්‍ය තර්කන පරිපථ සටහන අඳින්න.

F = (A AND B) OR (NOT C)

c) 1010111_2 ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව බවට පරිවර්ථනය කරන්න. පියවර ලියා දක්වන්න.

d) පරිගණක පද්ධතියක් සම්බන්ධයෙන් දී ඇති පහත ප්‍රකාශනයේ හිස්තැන් සඳහා අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

පරිශීලකයාට පරිගණක භාවිතා කිරීමට අතුරු මුහුණත ලබා දෙන්නේ .....A..... මගිනි. පරිගණකයේ සම්පත් කළමණාකරනයට සහයෝගය දක්වන්නේ .....B... හරහා වන අතර පරිශීලකයාගේ සුවිශේෂ කාර්යයන් ඉටුකරගැනීම සඳහා .....C... භාවිතා කරයි. ඒ සඳහා උදාහරණ ලෙස .....D..... දැක්විය හැක.

(වින්ඩෝස් 7, උපයෝගිතා මෘදුකාංග, මෙහෙයුම් පද්ධති, යෙදුම් මෘදුකාංග, වදන් සැකසුම් මෘදුකාංග, භාෂා පරිවර්ථක වැඩසටහන්)

e) රෝහලක් තුළ සංවේදක 3න් යුත් ගිණි ආවරණ පද්ධතියක් රෝහලේ ආරක්ෂාව පිණිස භාවිත කිරීමට අදහස් කරයි. මෙහි සංවේදක තුන නම්,

A- ගිනි දැල්ල හඳුනාගැනීමේ සංවේදකය B- දුමාරය හඳුනාගැනීමේ සංවේදකය

C- උෂ්ණත්වය 90^0C ට වඩා වැඩි බව හඳුනාගැනීමේ සංවේදකය.

මෙහි දී ගිනි දැල්ල හඳනාගැනීමේ සංවේදකය සමග අනෙත් සංවේදක දෙකෙන් එකක් හෝ සක්‍රීය වූ විට අනතුරු හැගවීමේ සීනුව නාද වේ.

ඉහත අවස්ථාව නිරූපනය කිරීමට සුදුසු තාර්කික පරිපථය නිර්මාණය කර ඊට අදාල බූලීය ප්‍රකාශනය ලියා දක්වන්න.

(2) a) පහත සඳහන් එක් එක් වගන්තියේ ඇති හිස්තැන් පිරවීමට වඩාත් සුදුසු පද පහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

(Forward, IP ලිපිනය, e-mail address (විද්‍යුත් තැපැල් ලිපිනය), Attachments (ඇමුණුම්), Webmail" Backward, Domain Name(වසම් නාමය))

1. අන්තර්ජාලයට සම්බන්ධ පරිගණක යන්ත්‍ර වලට හිමි අංකය .....වේ.
2. විද්‍යුත් තැපැල් හුවමාරුව සඳහා ඔබ සතුව .....තිබිය යුතුය.
3. විද්‍යුත් තැපැල් යැවීම හෝ ලැබීම සඳහා .....වැනි විද්‍යුත් තැපැල් මෘදුකාංගයක් තිබිය යුතුය.
4. විද්‍යුත් තැපැල් ලිපිය සමඟ යවන ඊට සම්බන්ධ නොවූ වෙනම ගොනු .....ලෙස හඳුන්වයි.
5. තමාට ලැබුණු විද්‍යුත් තැපැල් ලිපියක් වෙනත් කෙනෙකුට යැවීම .....කිරීම ලෙස හඳුන්වයි.

b) පහත දක්වා ඇති HTML මූල කේතය සහ එයට අදාළ ප්‍රතිදානය සලකන්න. මූල කේතයේ 1-10 දක්වා ඇති ස්ථාන වලට අවශ්‍ය නිවැරදි ඇමුණුම් (Tags) යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.
ලැයිස්තුව : { hr , tr , th , ol , ul , href , src , body , p , table }

කේතය	ප්‍රතිදානය
<html> <head> <title> ABC Turtle Conservation Centre </title> </head> **<....1.... >** <h2> ABC Turtle Conservation Centre </h2> <img **...2...** = "abc.jpg" height="100px" width="200px"> **<...3...>** ABC Turtle Conservation Centre is located at Colombo 5 in the western province.</p> <h4> Turtles are in danger. </h4> **<...4...>** <**...5...** border=2> <caption> What we did in last 3 years </caption> <**...6...**> <**...7...**> Year </**...7...**> <**...7...**> Type </**...7...**> <**...7...**> Number conserved </**...7...**> </**...6...**> <tr> <td> 2012 </td> <td> Adults </td> <td> 40 </td> </tr> <tr> <td> 2013 </td> <td> Off springs</td> <td> 80 </td> </tr> <tr> <td> 2014 </td> <td> Eggs</td> <td> 100 </td> </tr> </table> <h4> <**...8...** type= "circle"> - Let's save turtles by refusing <**...9...**> - Turtle eggs - Turtle soup </h4> More details <a **...10...** = "http://ABC.MNET.LK" > Young Zoologists Association </body> </html>	**ABC Turtle Conservation Centre** ABC Turtle Conservation Centre is located at Colombo 5 in the western province. **Turtles are in danger.** What we did in last 3 years **Year** | **Type** | **Number conserved** 2012 | Adults | 40 2013 | Off springs | 80 2014 | Eggs | 100 ○ **Let's save turtles by refusing** **1. Turtle eggs** **2. Turtle soup** More details Young Zoologists Association

(3) a) එක්තරා පාසලක වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා තරඟ වලට අදාළ දත්ත පහත වගුවේ අඩංගු වන අතර නිවාසවල එක් එක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට එක් ඉසව්වකට වඩා තෝරා ගත හැකිය.

Index No	Student Name	Gender	Date Of Birth	House Name	Event Code	Event Name
12435	Suranga Gamage	Male	05-09-1998	Gemunu	A001	100 m
12435	Suranga Gamage	Male	05-09-1998	Gemunu	A002	100 m x 4
12534	Kasuni Bandara	Female	16-10-1999	Gajaba	A001	100 m

(1) දත්ත සමුදායකයක ඉහත නිදසුන් වගුව සකස් කර දත්ත ඇතුළත් කිරීමට යාමේ දී මුහුණ දෙන ප්‍රධානතම දුෂ්කරතාව හඳුන්වා එය කෙටියෙන් පැහැදිලි කරන්න.

(2) එය වැලැක්වීමට ඔබ යෝජනා කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) ඉහත නිදසුන් වගුවෙහි Index No යන ක්ෂේත්‍රය සඳහා Number යන දත්ත ප්‍රරූපය සුදුසු වන්නේ නම් සෙසු ක්ෂේත්‍ර නිරූපණය කිරීමට වඩාත් ම සුදුසු දත්ත ප්‍රරූප (data types) හඳුන්වා දෙන්න.

(4) දත්ත සමුදාය නිවැරදිව සකස් කිරීමෙන් පසු සියලු ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නාම ලේඛනයක් ලබා ගැනීමට යොදාගත හැකි දත්ත සමුදා කළමනාකරණ පද්ධති (DBMS) මෘදුකාංගයේ ඇති සංරචකය (object) කුමක්ද?

b) පහත දැක්වෙන්නේ ගොළුවැව විද්‍යාලයේ වැටුප් ලේඛනය සැකසීමේ දී භාවිතා කළ වැඩපතයි. ඒ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

	A	B	C	D	E
1	**ගොළුවැව විද්‍යාලය**				
2	**2018 ජනවාරි මස වැටුප් ලේඛනය**				
3	**නම**	**මූලික වැටුප**	**ප්‍රාදේශිය සංවර්ධන බැංකු ණය**	**ගුරුසෙත ණය වාරික**	**ගෙවූ වැටුප**
4	D.MD. බස්නායක මයා	37584.23	4500	10500	22384.23
5	A.P.S. ගුණතුංග මිය	35465.28	2500	12500	20265.28
6	T.M.P. තෙන්නකෝන් මයා	44503.69	0	0	44303.69
7	W.A.C. දිසානායක මිය	39562.44	0	17800	21562.44
8	K.G.R. කරුණානායක මයා	45615.35	0	0	45415.35
9	මුළු මූලික වැටුප				
10	ගුරු සුබසාධක සංගමය	200	1000		
11	මුලු ගුරුවරු සංඛ්‍යාව	5			

1. මුලු මූලික වැටුප ගණනය කිරීමට අදාලව B9 කොෂයේ ලිවිය යුතු සූත්‍රය කෝෂ ලිපින පමණක් භාවිතා කර ලියා දක්වන්න.
2. මුලු ගුරුසෙත ණය වාරික D9 කෝෂයට ලබා ගැනීමට අදාල වන ශ්‍රිතය =function1(cell 1 : cell2) ආකාරයට ලියා දක්වන්න.
3. මුලු ගුරුවරු සංඛ්‍යාව B11 කෝෂයට ලබා ගැනීමට භාවිතා කරන ශ්‍රිතය නම් කරන්න.
4. ගුරු සුබසාධක සංගමයට මාසිකව එක් අයෙකුගෙන් රු. 200 බැගින් අය කරයි. මාසිකව ගුරු සුබසාධක සංගමයට ලැබෙන මුළු මුදල C10 කෝෂයට ලබාගැනීමට අදාල සූත්‍රය ලියා දක්වන්න
5. ගෙවූ වැටුප ගණනය කරනු ලබන්නේ
මූලික වැටුප - ප්‍රාදේශිය සංවර්ධන බැංකු ණය - ගුරු සෙත ණය වාරික - ගුරු සුභසාධක සංගමයට අය කිරීම් යන සමීකරණයට අනුවයි. කෝෂ ලිපින භාවිතයෙන් බස්නායක මහතාගේ ගෙවූ වැටුප E4 කෝෂයට ලබා ගැනීමට අදාල සූත්‍රය ලියා දක්වන්න.
6. E4 කෝෂයේ සූත්‍රය භාවිතයෙන් අනෙක් ගුරුවරුන්ගේ ගෙවූ වැටුප E8 කෝෂය දක්වා ලබාගන්නා ආකාරය ලියා දක්වන්න.

(4) a) පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ගුණාත්මක සමර්පණයක අඩංගු විය යුතු ලක්ෂණ 2ක් ලියන්න.
2. සමර්පණයකට අන්තර්ගත කරන බහුමාධ්‍ය ආකාර 2ක් ලියන්න.
3. විද්‍යුත් සමර්පණයක ගොනු නාමයක භාවිතා වන ගොනු දිගුවක් ලියන්න?
4. පහත වගුව සලකා බලා "අ" තීරුවේ අයිතමයට ගැලපෙන අයිතමය "ආ " තීරුවෙන් තෝරන්න.

අ	ආ
1.	A. සමර්පන නිර්මාණය කිරීම කළ හැකි දසුන් තිරුවයි
2.	B. කදා අනුපිළිවෙලට සැකසීම සඳහා අවකාශ සලසයි.
3.	C. කදාවක් තුළ තිබෙන සියලු දේ මෙහි දී පැහැදිලිව කියවා බැලිය හැකිය.
4.	D. ඉ-සමර්පණයක් ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීම සඳහා යොදාගනී.

b) පහත එක් එක් කෙටි මං යතුරු වල ක්‍රියාකාරිත්වය ලියා දක්වන්න.

කෙටි මං යතුර	ක්‍රියාකාරිත්වය
CTRL + C	
CTRL + V	
CTRL + S	
CTRL + O	
CTRL + X	
CTRL + N	

c) පහත දක්වා ඇත්තේ වදන් සැකසුම් මෘදුකාංගයත් භවිතයෙන් සැකසූ ලිපියක කොටසකි.

Insert a table A

In Microsoft Word, you can insert a table by in three ways: choosing from a selection of preformatted tables — complete with sample data — or by selecting the number of rows and columns that you want. You can insert a table into a document, or you can insert one table into another table to create a more complex table. C

B

- Choose from a gallery of preformatted table templates.
- Use the Table

D **Student details**

Name	School	Gender	Date of birth
A.A. Ruvinda bandara	Sumangala M.V	male	2000.06.20
P.A. Ashoka Basnayaka	Vijayaba N.C	male	2000.10.23
D.M.Hemathilaka	U.B.Wanninayaka Model School	Female	2000.08.06

MS Word මෘදුකාංගයේ රිබනයේ හැඩසව් මෙවලම් කොටසක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



පහත එක් එක් හැඩසව් කිරීම් සඳහා භාවිතා කරන මෙවලම්වල ලේබල් අංකය සඳහන් කරන්න
(නිවැරදි පිළිතුර ඇතුළුව අයිකන කිහිපයක් සඳහන් කලහොත් ලකුණු හිමි නොවේ)

1. A ලෙස ලේබල් කර ඇති මාතෘකාව මැදට එකෙල්ල කිරීම.
2. B ලෙස ලේබල් කර ඇති ඡේදය හැඩගැස්වීම සඳහා
3. ඉහත වගුවේ D ලෙස ලේබල් කර ඇති පේලිය සැකසීම සඳහා
4. A.A. රුවින්ද බංඩාරගේ රෙකෝඩයට පහලින් නව රෙකෝඩයක් වගුවට ඇතුල් කිරීම සඳහා
5. Gender යන තීරුව ගැහැණු හා පිරිමි ලෙස තීරු 2කට වෙන් කර ගැනීම සඳහා
6. C ලෙස ලේබල් කර ඇති ලැයිස්තුව සැකසීම සඳහා

(5) a) තොරතුරු තාක්ෂණය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය බවට පරිවර්තනය වූයේ මෑත කාලයේ ඉතා සීඝ්‍රයෙන් සිදු වූ සන්නිවේදන විප්ලවය නිසාය. පරිගණක ජාල කරණය මේ සඳහා පූර්ණ ලෙස බලපා ඇති බව නොරහසකි.

1. භූ ගෝලීය ව්‍යාප්තිය අනුව පරිගණක ජාල බෙදා දැක්වෙන ආකාර 03 දක්වන්න.
2. ජාල කරණයේ වාසි දෙකක් සහ අවාසි දෙකක් ලියන්න.
3. මොඩමයක කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.
4. 'ගිනි පවුර' යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
5. පරිගණක ජාල ගත කිරීමේ දී යොදා ගන්නා නියමු මාධ්‍ය දෙකක් සහ නියමු නොවන මාධ්‍ය දෙකක් සඳහන් කරන්න.

b) පහතින් දැක්වෙන අසම්පූර්ණ වගන්තිවල 1 සිට 6 දක්වා හිස්ව ඇති ලේබලවලට වඩාත්ම ගැළපෙන පද පහත ලැයිස්තුවෙන් තෝරා අංකය සමඟ ඉදිරියෙන් ලියන්න.

1. එක් මාතෘකාවකට අදාළ වෙබ් පිටුවල එකතුවක් ..... (1) ලෙස හැඳින්වෙයි.
2. HTML භාවිතයෙන් නිර්මාණය කරන ලද වෙබ් පිටුවක් නැරඹීම සඳහා ..... (2) භාවිතා කරයි.
3. වෙබ් ගොනුවක් ..... (3) මඟින් අනන්‍යව හඳුනා ගනියි.
4. ..... (4) වෙබ් පිටු සම්බන්ධ කිරීමට භාවිතා කරයි.
5. වෙබ් පිටුවක් දර්ශනය විය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ..... (5) මඟින් වෙබ් අතිරික්සුවට ලබා දෙයි.
6. වෙබ් අඩවියකට ප්‍රවේශ වන විට මුලින්ම දර්ශනය වන පිටුව හඳුන්වන්නේ, ... (6) ලෙසය.

(ලැයිස්තුව - මුල්පිටුව, වෙබ් අඩවිය, වෙබ් අතිරික්සුව, ඒකාකාර සම්පත් නිශ්චායකය, උපදෙස් ඇමුණුම්, අධි සන්ධාන, වෙබ් සැකසුම් මෙවලම්)

(6) a) පහත වගුවේ දී ඇති A සිට E ප්‍රකාශ වලට ගැලපෙන පදය දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලේඛල අංකය සමග ලියා දක්වන්න.

(ප්‍රති වෛරස් මෘදුකාංග -(antivirus software) / හානිකර මෘදුකාංග (Malware) / , ලිඛිත දෑ සොරකම (plagiarism) / භෞතික ආරක්ෂාව (physical security) / තාර්කික ආරක්ෂාව (logical security)/ ගිණිපවුර (firewalls) / චෞරත්වය

A	පරිගණක පද්ධතියට මුරපද යොදා තිබීම
B	වෙනත් අයෙකුගේ ලියවිල්ලක් තමාගේ ලියවිල්ලක් සේ ප්‍රකාශයට පත් කිරීම
C	වෛරස , වර්ම් , ට්‍රෝජන් අශ්වයා යනු උදාහරණ වේ
D	සේවා දායක පරිගණක කාමරයේ දොර අගුළු දමා තිබීම.
E	අවසර ලබාගැනීමක් හෝ ගෙවීමක් සිදු නොකර ප්‍රකාශන හිමිකම සහිත මෘදුකාංග බා ගැනීම

b) සංඛ්‍යාංක බෙදීම යනු තොරතුරු තාක්ෂණික දැනුම ඇති සහ නැති අය අතර පරතරයයි. ශ්‍රී ලංකා රජය විසින් ආංකික බෙදුම අවම කිරීමට ගෙන ඇති පියවර 02 ක් ලියන්න.

c) මාර්ගගත සාප්පු සවාරිය ජනප්‍රිය වෙමින් පවති. සාමාන්‍ය සාප්පු සවාරිය සමග සසඳන විට මාර්ගගත සාප්පු සවාරියේ ඇති වාසි 02 ක් සහ අවාසි 01ක් ලියන්න.

d) පරිගණකයක් මිලදි ගැනීමේදී සලකා බැලිය යුතු තාක්ෂණික ගුණාංග 03 ක් සහ තාක්ෂණික නොවන ගුණාංග 01 සඳහන් කරන්න.

තෙවන වාර පරීක්ෂණය - 2018

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය -12 ශ්‍රේණිය

පිළිතුරු - 1 පත්‍රය

1 පත්‍රය

1	iii	11	ii	21	ii	31	iii
2	ii	12	iii	22	ii	32	i
3	i	13	iii	23	iii	33	ii
4	ii	14	i	24	i	34	ii
5	ii	15	i	25	iv	35	ii
6	i	16	iii	26	ii	36	iii
7	ii	17	iv	27	ii	37	i
8	iii	18	ii	28	ii	38	iii
9	iii	19	ii	29	iv	39	ii
10	ii	20	i	30	iv	40	iv

II පත්‍රය

1) .

a)

A	B	A.B
0	0	0
0	1	0
1	0	0
1	1	1



ලකුණු 03

b)



ලකුණු 03

c)

1	0	1	0	1	1	1
(64x1)	+(32x0)	+(16x1)	+(8x0)	+(4x1)	+(2x1)	+(1x1)
64	+0	+16	+0	+4	+2	+1

87

ලකුණු 02

d) A – මෙහෙයුම් පද්ධති
B – උපයෝගිතා මෘදුකාංග
C – යෙදුම් මෘදුකාංග
D – වදන් සැකසුම් මෘදුකාංග

ලකුණු 02

e) A . (B + C) ලකුණු 02



ලකුණු 03

2)

a)

i. IP ලිපිනය
ii. විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail)
iii. Web mail
iv. ඇමුණුම් (Attachment)
v. Forward

ලකුණු 01 x 05

b)

i. Body
ii. Src
iii. P
iv. Hr
v. Table
vi. TR
vii. TH
viii. UL
ix. OL
x. Href

ලකුණු 1 x 10

3)

a)

i. දත්ත අනුපිටපත්වීම. ලකුණු 01
වගුවක එක් එක් තීරුවල දත්ත නැවත නැවත ඇතුලත්වීම. උදා. Student name තිරුවේ Suranga Gamage යන නම දෙවතාවක් ඇතුලත්වීම. ලකුණු 01

ii. තනි වගුවක් වගු කිහිපයකට වෙන්කර සම්බන්ධිත දත්ත සමුදායක් නිර්මාණය කිරීම.

iii. Student name – Text
Gender – Text
Date of birth – Date / Time
House name – Text
Event Name – Text
Event code – Text
ලකුණු 01
ලකුණු 03

iv. වාර්තා (Report) ලකුණු 01

b)

i. =B4 + B5 + B6 + B7 + B8 ලකුණු 02

ii. Function 1 - = sum Cell 1 – D4 Cell 2 - D8 හෝ = Sum (D4 : D8) ලකුණු 02

iii. Count ලකුණු 01

iv. = B10 * B11 ලකුණු 01

v. = B4 – C4 – D4 – B$10 ලකුණු 02

4)

a) .

i. අඩංගු විය යුතු වාක්‍ය පේළි ප්‍රමාණය (කදාවකට උචිත වන්නේ පේළි 6 – 9 අතර ප්‍රමාණයක්).
අකුරුවල විශාලත්වය
අක්ෂර වින්‍යාසය හා භාෂා යෙදුම් නිවැරදි වීම
පින්තූර , චිත්‍රක හෝ වගු සහ ප්‍රස්තාර ඇතුළත් කිරීම ලකුණු 02
අරමුණ ඉලක්ක ගත කිරීම

ii. රූප /වීඩියෝ/ශබ්ධ/ අකුරු/ චලන රූප ලකුණු 01

iii. .ppt/ .pptx ලකුණු 01

iv. 1. – B / 2 – A /3.- D / 4. – C ලකුණු 02

b)

කෙටි මං යතුර	ක්‍රියාකාරිත්වය
CTRL + C	copy
CTRL + V	paste
CTRL + S	save
CTRL + O	open
CTRL + X	cut
CTRL + N	New document

ලකුණු 03

c)

i. 4
ii. 2
iii. 8
iv. 18
v. 16
vi. 11

ලකුණු 06

5) .

a) 1. ස්ථානීය ප්‍රදේශ ජාල - LAN පුරවර ප්‍රදේශ ජාල - MAN
පුළුල් ප්‍රදේශ ජාල - WAN ලකුණු 03

2. **<u>වාසි</u>** - දත්ත තොරතුරු හුවමාරු කරගතහැකිවීම, අඩු ඉඩක දත්ත ගබඩා කළ හැකි වීම, සම්පත් පොදුවේ භාවිතය, විද්‍යුත් තැපෑල භාවිතය වැනි පිළිතුරු ලකුණු 01

<u>අවාසි</u> - වෛරසයක් ඇතුළුවුවහොත් ජාලය පුරා ව්‍යාප්ත වීම, විශේෂ පුහුණු අවශ්‍යතා අවශ්‍ය වීම, ජාල පද්ධතියේ ඇතිවන දෝෂ නිසා වත්ත තොරුරු හුවමාරුවට බාධා ඇති වීම වැනි පිළිතුරු ලකුණු 01

3. ප්‍රතිසම සංඥා සංඛ්‍යාංක සංඥා බවටත් සංඛ්‍යාංක සංඥා ප්‍රතිසම සඥා බවටත් පරිවර්ථනය කිරීම. ලකුණු 01

4. අන්තර්ජාලය හා පරිගණක ජාල අතර දත්ත තොරතුරු සම්ප්‍රේෂණයේ දී ආරක්ෂක බාධයක් ලෙස භාවිතා කරයි. මෙය දෘඩාංගයක් හෝ මෘදුකාංගයක් ලෙස පැවතිය හැක. ලකුණු 02

5. **<u>නියමු මාධ්‍යය -</u>** වැසුණු / නොවැසුණු ඇඹරූ කම්බි යුගල (STP / UTP) , සමාක්ෂක කේබල, ප්‍රකාශ තන්තු
<u>නියමු නොවන මාධ්‍ය</u> - ගුවන් විදුලි තරංග (wife, Bluetooth, wimax), ක්ෂුද්‍ර තරංග, අධෝරක්ත කිරණ
ලකුණු 02

b) 1. වෙබ්අඩවිය
2. වෙබ් අතිරික්සුව
3. ඒකාකාර සම්පත් නිශ්චායකය
4. අධි සන්ධාන
5. උපදේශ ඇමුණුම්

ලකුණු 01 x 05 = 05

6)

a) A – තාර්කික ආරක්ෂාව
B – ලිඛිත දෑ සොරකම
C – හානිකර මෘදුකාංග
D – භෞතික ආරක්ෂාව
E – චෞරත්වය ලකුණු 05

b) දුෂ්කර පාසල්වලට පරිගණක ලබාදීම
පරිගණක සම්පත් මධ්‍යස්ථාන ඇති කිරීම
විදාතා /නැණසල වැනි ආයතන හරහා පරිගණක සාක්ෂරතාවය වැඩි කිරීමට කටයුතු කිරීම.
අඩු මිලට පරිගණක ලබාදීම වැනි පිළිතුරු වැනි පිළිතුරු ලකුණු 03

c) <u>වාසි</u>

- ඕනෑම වේලාවක / ඕනෑම ස්ථානයක සිට සම්බන්ධ වීමේ හැකියාව
- ප්‍රවාහන වියදම් නොමැතිවීම
- ජාත්‍යන්තර වෙළඳ පොළ හරහා භාණ්ඩ තෝරාගත හැකි වීම
- පහසුවෙන් ඇණවුම් කළ හැකි වීම වැනි පිළිතුරු
- දින 365 ම විවෘත වී තිබීම වැනි පිළිතුරු ලකුණු 02

<u>අවාසි</u>

- ඇඳුම් වැනි දෑ තෝරා ගැනීම අපහසුවීම
- ගෙවීම් කිරීමේ දී ඇති අවදානම (හරපත් හා බැරපත් භාවිතයට සිදුවීම)
- භාණ්ඩ මාරුකර ගැනීමේ අපහසුතාවය ලකුණු 01

d) <u>තාක්ෂණික ගුණාංග</u>

- දෘඩ තැටියේ ධාරිතාවය
- RAM හි ධාරිතාවය
- සකසනයේ වේගය / වර්ගය/
- සංදර්ශකයේ විභේදනය ලකුණු 03

<u>තාක්ෂණික නොවන ගුණාංග</u>

- මිල
- මිලදී ගැනීමෙන් පසු සේවාව
- ආයතනයේ කීර්තිනාමය ලකුණු 01